සියලුම හිමිකම් ඇවිරිණි
(All Right Reserved)

කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ

විකසිත - 2025

05 ශ්‍රේණිය සිසුන් සඳහා විභව්‍යතාමාන ඇසුරෙන් සැකසූ ඇගයීම් වැඩසටහන

පැය එකයි

විභාග අංකය /නම :- ..... **ශ්‍රේණිය :-** .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ **විභාග අංකය/නම** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය/නම** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු 03 ක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න**.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේතය
පළමු පරීක්ෂක	
ලකුණුදීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බවට සහතික කරමි.	**V/I/S**
දෙවන පරීක්ෂක	
පළමු පරීක්ෂක කර ඇති ඇගයීම නිවැරදි බව සහතික කරමි.	**V/I/S**
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ එකතුව නිවැරදි බව තහවුරු කරමි.	**V/I/S**
ප්‍රධාන පරීක්ෂක	
අධීක්ෂණය කළෙමි. අවසානලකුණු නිවැරදිය.	**V/I/S**

01 පහත රූප දෙක පිළිබඳව සඳහන් කර ඇති ප්‍රකාශය අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.




A



B

1. A රූපය සහ B රූපය යන දෙකෙහිම සිටි ළමයින් අවට පිරිසිදු කිරීම හා අලංකාර කිරීමේ කටයුත්තක යෙදෙන අයුරු දැක්වෙයි.
2. A රූපයේ ළමයින් සාමූහික ක්‍රියාකාරකමක යෙදෙන අතර B රූපයේ ළමයින් ක්‍රීඩා කරමින් සිටිති.
3. B රූපයේ ගොඩනැගිල්ලක් දක්නට ඇති අතර A රූපයේ නොමැත.

02. 

මෙම රූපය සම්පූර්ණ කිරීමට අවශ්‍ය කොටස තෝරන්න.

1. 
2. 
3. 

03. පහත වාක්‍යයෙහි තද කළු අකුරින් ඇති වචන වෙනුවට පිළිවෙළින් යොදා ගත හැකි වචන කට්ටලය කුමක්ද?

දකුණු ආසියාවේ පිහිටි **දැකුම්කලු** පුංචි දිවයිනක් වන ශ්‍රී ලංකාව **බොහෝ ජාතීන්** **වාසය කරන** රටකි. එහි විවිධ සංස්කෘතීන් මිශ්‍රව පවතින අතර ලංකාව **උපතින් ම නිජබිම කරගත්** ගස්වැල් සත්තු එහි සුන්දරත්වය දෙගුණ තෙගුණ කරති.

1. රමණීය, ජනප්‍රිය, උරුමයකි
2. අලංකෘත, ජනාකීර්ණ, ආවේණික
3. රමණීය, බහුජාතික, ආවේණික

04. පහත සටහනෙහි හිස්තැන් සඳහා සුදුසු වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

රියදුරා	බසය	iii. ……...
i. ……...	ඔරුව	ජලය
ගුවන් නියමුවා	ii. ……...	ගුවන

1. ගෙඩබිම, නැවියා, අහස
2. තොටියා, ගුවන් යානය, ගොඩබිම
3. නැවියා, නැව, ගුවන

05. පියාඹන්න හැකිය මෙමට
අත්තටු නැත මගෙ සිරුරට
අඬන්න පුළුවනි මා හට
දෑස් නොමැත මගෙ මුහුණට
ඉහත කවියෙන් කියවෙන්නේ කුමක් ගැනද?

1. සුළඟ 2. උකුස්සා 3. වලාකුළ

06. පහත ප්‍රකාශ දෙක පදනම් කරගෙන පිළිතුරු සපයන්න.

1. ප්‍රකාශය

මෝටර් රථයකින් A නගරයේ සිට B නගරයට එකම වේගයකින් යාමට පැය 1 මිනිත්තු 20 ක් ගත වේ.


2. ප්‍රකාශය

එම මෝටර් රථය B නගරයේ සිට A නගරයට එම වේගයෙන්ම ඒමට මිනිත්තු 80 ක් ගත වේ.


ඉහත ප්‍රකාශ අනුව නිවැරදි පිළිතුර වන්නේ,

1. A සිට B ට යාමට ගත වූ කාලයට වඩා අඩු කාලයක් B සිට A ට යාමට ගත වී ඇත.
2. B සිට A ට ඒමට ගත වූ කාලයට වඩා අඩු කාලයක් A සිට B ට යාමට ගත වී ඇත.
3. A සිට B ට යාමටත් B සිට A ට ඒමටත් සමාන කාලයක් ගතවිය.

07. රටාව අනුව ? ලකුණ ඇති කොටුවට තිබිය යුතු පිළිතුර තෝරා යටින් ඉරක් ඇඳින්න.




2. 
1. 
3. 

08. 


මෙම රටාවේ හිස් කොටුවට තිබිය යුතු සංඛ්‍යාව වන්නේ,

1. 9
2. 3
3. 6


09. 

රූපයේ ඇති ඝනකයේ කඩ ඉරි ඔස්සේ ලකුණු කර ඇති A කොටස කපා ඉවත් කළ විට ඉතිරිවන B කොටසේ ඇති මුහුණත් ගණන සහ ඉවත් කළ කොටස කුමන ඝන වස්තුවක් දැයි තෝරන්න.


1. මුහුණත් 4, ත්‍රිකෝණය 2. මුහුණත් 7, චතුස්තලය 3. මුහුණත් 6, ඝනකාභය

10. 

හිඩැස්පත



A



B


ඉහත හිඩැස්පත විවිධාකාරයෙන් භාවිතා කර

1. AB දෙකම ඇඳිය නොහැකි ය.
2. A පමණක් ඇඳිය හැකිය.
3. A , B රූප දෙකම ඇඳිය හැකිය

11. අළු, නිල්, දුඹුරු, කළු යන පාටවලින් මේස් පෝඩු 4 ක් බඳුනක ඇත. බඳුන දෙස නොබලා එයින් එක ම වර්ණයෙන් මේස් පෝඩුවක් ලබාගැනීමට නම් ඉවතට ගත යුතු අවම මේස් ගණන කීය ද? (වරකට මේස් එක බැගින් ඉවතට ගනියි.)
    1. 2
    2. 7
    3. 5

12. කාඩ්බෝඩ් එකක සිසුවෙකු අඳින ලද ඔරලෝසුවක් රූපයේ දැක්වේ. මෙම ඔරලෝසුව එක් කොටසකට සංඛ්‍යා දෙකක් ලැබෙන සේත්, එම සංඛ්‍යා දෙකෙහි එකතුව සෑම කොටසකම සමාන වන සේත් කොටස් 6 කට වෙන් කළේ ය. එම එක් කැබැල්ලක සංඛ්‍යා දෙකක එකතුවේ අගය කීයද?

    1. 6
    2. 13
    3. 17



13. ශාලිකාගේ දුව මගේ දුව ගේ අම්මා නම් ශාලිකා යනු මගේ,
    1. බිරිඳ වේ
    2. අම්මා වේ
    3. නැන්දණිය (නැන්දම්මා)වේ

14. ළමයින් 4 දෙනෙකු එක සමාන වේගයකින් බනිස් ගෙඩි 4 ක් කෑම සඳහා මිනිත්තු 4 ක් ගත කරයි. එම ආකාරයටම ළමයින් දෙදෙනෙකු බනිස් ගෙඩි 2ක් කෑමට මිනිත්තු කීයක් ගත කරයි ද?
    1. මිනිත්තු 4
    2. මිනිත්තු 2
    3. මිනිත්තු 8

15. සිසුන් තිදෙනෙකු තමන් සතු මුදල් හුවමාරු කරගන්නා පියවර පහත දැක්වේ. මුදල් හුවමාරු කරගැනීමට පෙර තිදෙනා ළඟම රු. 100.00 බැගින් ඇත.


- පළමුව අමල් තමා සතු මුදලින් හරි අඩක් කමල්ට දුන්නේ ය.
- දෙවනුව කමල් සතු මුදලින් දෙකෙන් පංගුවක් නුවන්ට දුන්නේ ය.
- තෙවනුව නුවන් සතු මුදලින් රු.50 ක් අමල්ට දුන්නේ ය.

ඒ අනුව සිසුවාට හිමි මුදල නිවැරදිව දැක්වෙන්නේ,

1. අමල් රු. 75.00
2. කමල් රු. 100.00
3. නුවන් රු. 125.00


සියලුම හිමිකම් ඇවිරිණි... (All Right Reserved)

16. පහත ඝන වස්තුව හා පතරොම එකිනෙක නොගැළපන පිළිතුර තෝරන්න.



1.





2.



3.


17. පහත සංඛ්‍යා ජාලයේ හරහට හා පහළට එක ළඟ පිහිටි ඉලක්කම් දෙකක් ගුණකළ විට ලැබෙන පිළිතුර හතරේ ගුණාකාරයක් වන අවස්ථා ගණන කියද?

3	4	5
4	2	1
5	2	6

1. 7
2. 8
3. 6

18. පහත හිස්තැන් දෙක සඳහා වඩාත් සුදුසු වචන දෙක තෝරන්න.
සිසුන් _____ මුහුණ දීමේදී _____ දිරිමත් කරගත යුතුය.
1. විභාගයට - සිත 2. තරගවල - හිස 3. අභියෝගවලට – දෑස්

19.



ක්‍රීඩා උත්සවයේ ධාවන තරගයක අවස්ථා 6 ක් රූප රාමු ඇසුරින් පහත දැක්වේ. ඒවායේ නිවැරදි අනුපිළිවෙළට පෙළ ගස්වා ඇති පිළිතුර කුමක්ද?


1. A B C D E F
2. A B D F E C
3. A B F E D C

20. කුඩා ඝනක යොදාගෙන සිදු කර ඇති මෙම නිර්මාණයේ ඇති මුළු ඝනක ගණන කියද?




1. 66
2. 60
3. 65

21. රූපයේ ඇති මුළු ත්‍රිකෝණ ගණන කියද?



1. 11
2. 14
3. 10

22. 


මිදුලක ඇඳ ඇති ත්‍රිකෝණයක් රූපයේ දැක්වේ. එහි උතුරු දිශාව ද ලකුණු කර ඇත. ABC යන ස්ථාන තුනෙහි ළමයින් සිටගෙන සිටින්නේ, සුපුන්ට නිරිත දිශාවෙන් කසුන් ද නුවන්ට වයඹ දිශාවෙන් සුපුන් ද කසුන්ට නැගෙනහිර දිශාවෙන් නුවන්ද වන ලෙසට ය. මේ අනුව A B C ස්ථාවල සිටින සිසුන් පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක්ද?

1. සුපුන්, කසුන්, නුවන්
2. කසුන්, සුපුන්, නුවන්
3. නුවන්, කසුන්, සුපුන්




23. සිසුන් තිදෙනෙක් කැමති ආහාර වර්ග මෙසේ ය.
සිතුල් අඹ, දොඩම් සහ අයිස්ක්‍රීම්ය. උදාන දොඩම්වලට අකමැති නමුත් අයිස්ක්‍රීම් හා අඹ වලට කැමති ය. මිතුන් අයිස්ක්‍රීම් සහ අඹවලට අකමැති නැත. මේ අනුව තිදෙනා ම කැමති පළතුරු වර්ගය කුමක්ද?

1. දොඩම්
2. අයිස්ක්‍රීම්
3. අඹ

24. ඉදිරිපෙනුම පැති පෙනුම සැලැස්ම



ඝනක කිහිපයක් යොදාගෙන ගොඩ නගා ඇති නිර්මාණයහි ඉදිරි පෙනුම පැති පෙනුම සහ සැලැස්ම ඉහතින් දැක්වේ. ඒ අනුව එම ඝනක කිහිපයේ නිර්මාණය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

1. 
2. 
3. 

25. පන්තියක ළමයින් කිහිප දෙනෙකුගේ උස මෙසේ සටහන් වේ.
ජනිදු සුමිත්ට වඩා උස නමුත් සාලිය තරම් උස නැත. මනුක උසම කෙනා ය. ෆාතිමා ජනිඳු තරම් උස නොමැති නමුත් සුමිත්ට වඩා උසින් වැඩි ය. මෙම ළමයින් උස වැඩි බවේ සිට පිළිවෙළට පෙළගැස්වූ විට මුල සිට දෙවෙනියාත් අග සිට දෙවෙනියාත් පිළිවෙළින් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. සාලිය, ෆාතිමා
2. මනුක, සුමිත්
3. ෆාතිමා, සාලිය


26. මෙම ප්‍රහේලිකාවේ හිස් කොටු පිරවීමට අවශ්‍ය සංඛ්‍යා හතර තෝරන්න.


6	+	____	=	14
+	▨	+	▨	+
____	+	9		____
=	▨	=	▨	=
____	+	17	=	30

1. 13, 8, 7, 16
2. 16, 9, 17, 13
3. 13. 8, 7, 14

27. A කඩදාසි පටිය හා B කඩදාසි පටිය කවර ආකාරයෙන් සම්බන්ධ කළ ද දැකිය **නොහැකි** අවස්ථාව කුමක්ද?


A කඩදාසි පටිය


B කඩදාසි පටිය


1. 
2. 
3. 

28. සාමාන්‍ය ඔරලෝසුවක වේලාව ප.ව. 1.00 සිට ප.ව. 2.00 තෙක් කාලය අතරතුර පැය කටුව සහ මිනිත්තු කටුව අතර සෘජුකෝණයක් නිර්මාණය වන අවස්ථා ගණන කියද?


1. එකයි
2. දෙකයි
3. තුනයි.

29. එක ළඟ පිහිටි ඔත්තේ සංඛ්‍යා දෙකක එකතුව 16 කි. එම සංඛ්‍යා දෙක ගුණා කළ විට ලැබෙන පිළිතුරට 10 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව වන්නේ,

1. 63
2. 58
3. 73

30. 

පහත රූපයෙන් දැක්වෙන්නේ වැටක කොටසක් ඉදිරියෙන් බැලූ විට පෙනෙන ආකාරයයි. මෙම කොටස දෙස පිටුපසින් බැලූ විට පෙනෙන ආකාරය දක්වා ඇති නිවැරදි පිළිතුර කුමක්ද?

1. 
2. 
3. 

31. පේළියක දුලනි සහ ශනුකි එක ළඟ සිටින අතර ඔවුන්ගෙන් ශනුකි හරි මැද සිටියි. දුලනිට පිටුපසින් ළමයින් 5 දෙනෙක් සිටි නම් මෙම පේළියේ සිටිය හැකි **අවම** ළමයින් ගණන කියද?

1. 9
2. 11
3. 13

32. පන්තියක සිසුන් හතර දෙනා බැගින් වෙන් කළ විට එක් අයෙක් ද, දෙදෙනා බැගින් වෙන් කළ විට එක් අයෙක් ද පස්දෙනා බැගින් වෙන් කළ විට දෙදෙනෙක් ද හත් දෙනා බැගින් වෙන් කළ විට දෙදෙනෙක් ද බැගින් ඉතුරු වේ. මෙම පන්තියෙ සිටින මුළු සිසුන් ගණන කියද?

1. 43
2. 37
3. 33

33. පහතින් දැක්වෙන්නේ තිනුලි, ඉනුති සහ මෙතුනි යන සිසුවියන් මල් කඩන ආකාරය හා ඒ සඳහා ගත කරන කාලයයි.

ඉනුති	**තිනුලි**	**මෙතුනි**
මිනිත්තු 6 කදී මල් 8	**මිනිත්තු 4 කදී මල් 6**	**මිනිත්තු 3 කදී මල් 5**

මිනිත්තු 24 කදී වැඩිම මල් ප්‍රමාණයක් කඩන්නේ කවුද?

1. ඉනුති
2. තිනුලි
3. මෙතුනි

34. අවුරුද්දේ එක්තරා මාසයක සඳුදා දින 4 ක එකතුවට ලැබිය හැකි **අවම** අගය වන්නේ,

1. 58 2. 46 3. 70

35. පාසලක සිසුන් තිදෙනෙකු කළ ප්‍රකාශ පහත දැක්වේ.

සාරද : – ටීචර්.... මගේ පැන්සල අසංක ගත්තා.

අසංක : – නෑ ටීචර්... ඒක මට අම්මා අලුතෙන් අරන් දුන්නු එක

තුසිත : – ටීචර් අසංක බොරු කියන්නේ...

මේ අයගෙන් එක් ප්‍රකාශයක් පමණක් වැරදි නම් පැන්සලේ නියම හිමිකරු කවුද?

1. සාරද 2. අසංක 3. තුසිත


36. 

එකිනෙකට ප්‍රමාණයෙන් සමාන යකඩ බෝල අටක් ඇත. එයින් එකක් බරින් වැඩි ය. එම යකඩ බෝලය නිවැරදිව සොයා ගැනීමට මෙම රූපයේ ඇති තරාදිය භාවිත කළ යුතු **අවම** වාර ගණන වන්නේ,

1. 2 2. 3 3. 4

37. සිසුන් තිදෙනෙක් පුස්තකාලයට පැමිණියේ පහත පරිදි ය. රුවනි පෙ.ව. 8. 30ට ය. දසුන් රුවනිට මිනිත්තු 20 කට පසුව ය. කසුනි පැමිණියේ රුවනි පැමිණ මිනිත්තු 45 කට පසුව ය.
මේ තිදෙනාම දහවල් 12.00 ට පුස්තකාලයෙන් පිටව ගියේ නම් තිදෙනාම එකවර පුස්තකාලය තුළ රැඳී සිටි කාලය කොපමණ ද?


1. පැය 1 මිනිත්තු 45 2. පැය 2 මිනිත්තු 45 3. පැය 2 මිනිත්තු 15

38. 

මෙම භාජන දෙක පමණක් භාවිතා කර ලීටර 2 ක් මැන ගැනීමේදී ඉවතට යන අවම ජල ප්‍රමාණය කොපමණ ද?


1. 7*l* 2. 4*l* 3. 9*l*


39. පහත නිල් පෑන් සහිත බඳුන් තුනක් හා රතු පෑන් සහිත බඳුන් දෙකක් ඇත. සෑම බඳුනකම එහි ඇති පෑන් සංඛ්‍යා සඳහන් කර තිබේ. සිසුවෙක් ඉන් එක් බඳුනක් ඉවත් කළ හොත් මා හට රතු පෑන් මෙන් නිල් පෑන් දෙගුණයක් ඉතුරු වේ යැයි සිතුවේය. ඔහු ඉවත් කිරීමට සිතූ බඳුන වන්නේ කුමක්ද?



1. A
2. D
3. E

40. පහතින් දී ඇති හැඩතල වල සම්බන්ධතාවය හා අගයන් අනුව **?** යෙදෙන තැනට ගැළපෙන පිළිතුර කුමක්ද?



1. 
2. 
3. 